# ඉන්දියාවේ ප්‍රාග්ඓතිහාසික ගුහා චිත්‍ර ආශ්‍රිත සමූහ රූප

**පී.ආර්. අසංක බුද්ධිකසිරි**

පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය
asanka.buddikasiri8@gmail.com

---

ප්‍රාග්ඓතිහාසික යුගයට අයත් චිත්‍රවලින් අතීත මානවයා තුළ පැවති උත්කෘෂ්ට වූ සහජබුද්ධිය පිළිබඳව වර්තමාන මිනිසාට හෙළිකරගත හැකිය. මෙම පර්යේෂණයේ මූලික අරමුණවනුයේ ප්‍රාග් ඉන්දියාවේ ගුහා චිත්‍ර ආශ්‍රිත සමුහ රූප කෙරෙහි අවධානය යොමුකිරීමයි. මෙම කරුණ සාධනය කරගැනීම සඳහා මෙතෙක් සිදුකර ඇති ඉන්දියාවේ ප්‍රාග්ඓතිහාසික පර්යේෂණවල වාර්තා හා ද්‍රව්‍යාත්මක සාධක අධ්‍යයනය කිරීම මූලික ක්‍රමවේදය විය.

අතීතයේ සිටම පැවත එන අනිකුත් මානව වර්ග අතරින් ප්‍රාග්ඓතිහාසික යුගයට අයත් මානවයා අතිශයින් වැදගත්වීමෙහි ලා බලපානු ලබන ප්‍රධාන හේතුව ලෙස චිත්‍ර දැක්විය හැකිය. මෙම කාලයට අයත් ගුහාවල තිබී හමුවන චිත්‍ර ප්‍රාග්ඓතිහාසික මානවයා විසින් අඳින ලද ගුහා ඒවාය. ඉන්දියාවේ ප්‍රාග්ඓතිහාසික යුගයට අයත් චිත්‍ර පිළිබඳව අවධානය මුල්මවරට යොමු වීම ආරම්භ වූයේ 1856 දීය. ප්‍රාග් ඉන්දියා ගුහා චිත්‍ර ප්‍රධාන වශයෙන් අවධීන් කිහිපයක් යටතේ වර්ග කළ හැකිය. එනම් මෙසොලිතික යුගයේ සිතුවම්, කැලියොලිතික යුගයේ සිතුවම්, පැලියොලිතික යුගයේ සිතුවම් හා ඉන්දියානු ප්‍රාදේශීය ප්‍රදේශ ආශ්‍රිතව පිහිටි සිතුවම් වශයෙනි. මෙම සෑම අවධියක් තුළම දැක්වෙන සිතුවම් තුළ අඩංගු පොදු විශේෂතා කිහිපයක් දැකිය හැකි අතර එය ඉන්දියානු ගුහා ආශ්‍රිතව පිහිටි 'සමුහරූප' තුළින් එම විශේෂතා පැහැදිලි කරගත හැකි විය. එනම් මෙම සෑම අවධියකම දක්නට ලැබෙන සිතුවම්වල පොදු ලක්ෂණ අතර වර්ණ භාවිතය, ශෛලිය සහ වස්තු විෂය බොහෝ අවස්ථාවන්හිදී සමානත්වයක් දැකිය හැකිය. මෙහිදී සෑම අවධියකම පාහේ සිතුවම් සඳහා රතු වර්ණය පාදකවී තිබේ. එමෙන්ම ශෛලීය ලක්ෂණ අතර රේඛා භාවිතය, හැඩතල භාවිතය ආදී ලක්ෂණ දැකගත හැකි ය. වස්තු විෂයය ලෙස දඩයම් කිරීම හා එක්රැස් කිරීම, ගවයන් ඇති කිරීම, හීලෑ කිරීම, යුද්ධ කිරීම, විනෝදය සහ නර්තනය ආදිය ගැබ්වී තිබේ. මේ අනුව එම ලක්ෂණ ප්‍රාග් ඉන්දීය ගුහා ආශ්‍රිතව ඇති සමූහ රූප මගින් පැහැදිලි කරගත හැකි බව සඳහන් කළ හැකිය.

විශේෂයෙන්ම මෙහිදී දක්වෙන සමූහ රූපයන් තුළින් පෙන්වන පණිවිඩ හරහා කියැවෙන්නේ ඔවුන් යම්කිසි ක්‍රියාකාරකමක් හා බද්ධවී කටයුතු කිරීම පිළිබඳවය. දඩයම, කෘෂිකර්මාන්තය හා බැඳුණු ජීවන රටාවන්, විවිධ සටන් ක්‍රම, සාකච්ඡා, පාබල හමුදාවන් ආදී පුද්ගලානුබද්ධ සිදුවීම් මේ කණ්ඩායම් රූප (සමුහ රූප) සඳහා පාදකවී ඇති බව ප්‍රාග් ඉන්දීය ගුහා සිතුවම් කෙරෙහි අවධානය යොමුකිරීමේදී පැහැදිලි වේ. එම සමූහ රූප රැගත් ගුහා සිතුවම් දක්වෙන ස්ථාන වශයෙන් Bhimbetka, Bagdani, Hathiol සහ Satkunda පෙන්විය හැකිය.

ප්‍රමුඛ පද : ප්‍රාග්ඓතිහාසිය, ගුහා චිත්‍ර/සිතුවම්, සමූහ රූප